**ශීර්ෂය 208 ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 අප්‍රේල් 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අප්‍රේල් 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මූලධන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2021 මූල්‍ය ප්‍රකාශනවල වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ (ඒසීඒ - 2 (i)) අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වර්ෂය තුළදී එකතුව රු.78,328,980 ක මුදලක් වැය කර තිබුණි. නමුත්, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂය තුළ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැණුම් එකතුව රු.27,181,790 ක් ලෙස සටහන් කිරීම නිසා වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමට දරන ලද වියදම රු.51,147,190 ක් අඩුවෙන් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර තිබුණි. | රු.78,328,980 යනු වර්ෂය තුළ අත්පත් කරගත් මූලධන වත්කම් වල සමස්ථ වටිනාකම වන අතර, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇති රු.27,181,790 යනු යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වල වටිනාකම පමණක් වේ. | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ඇතුළු සියලු මූලධන වත්කම් අත්පත් කර ගැනීම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සටහන් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2020 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ - 6) එකතු වටිනාකම රු.77,967,446 ක් විය. 2021 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ එම ආරම්භක ශේෂය රු.91,659,556 ක් ලෙස සටහන් කිරීම නිසා 2021 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ - 6) ආරම්භක ශේෂය රු.13,692,110 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | 2021 වර්ෂයේ සිදු කළ ආරම්භක ශේෂ ගැලපීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වල ආරම්භක ශේෂය වෙනස් වී ඇත. | 2021 වර්ෂයේ ආරම්භක මූල්‍ය නොවන වත්කම් වල ශේෂය කළ ගැලපීම මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලිව හෙළිදරව් කළ යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කොළඹ ජාතික කෞතුකාගාරය පිහිටුවා ඇති හෙක්ටයාර් 4.6317 ක ඉඩම 2022 මාර්තු මස 29 දින වන විටත් කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ එම ඉඩම හා ගොඩනැගිල්ල 2013 වර්ෂයේ සිදු කළ තක්සේරු වාර්තාවක් පදනම් කරගෙන පිළිවෙලින් රු.10,002,369,340 ක් සහ රු.800,000,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉඩම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇති අතර, වාර්තා ලද පසු ගිණුම්ගත කරනු ලැබේ. | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල හා ඉඩම තක්සේරු කර තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | දෙපාර්තමේන්තුවේ කෞතුකාගාර තුළ ප්‍රදර්ශනය සඳහා පවතින කෞතුක භාණ්ඩ පිළිබඳව භෞතික සමීක්ෂණයක් සිදුකර එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම භාණ්ඩ 2018 වර්ෂයෙන් පසුව නැවත 2021 වර්ෂයේදී අංශ 06 ක පමණක් සමීක්ෂණය කර තිබුණි. එම සමීක්ෂණ මණ්ඩල අවසන් වාර්තාවක්ද 2022 මාර්තු මස දක්වා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂයේදී සමීක්ෂණයක් කර ඇති අතර, නැවත 2023 වර්ෂයේදී සමීක්ෂණය කිරීමට පියවර ගනු ඇත. | ප්‍රදර්ශනය සඳහා පවතින කෞතුක භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(i) ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප ලේඛනයක් පිළියෙල කර රියදුරු මහතුන්ගේ ඇප තැන්පත් කිරීම මේ වන විට සිදු කර ඇත. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| **(ii) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මෙම ලේඛනය සකස් කරමින් පවතී. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. |
| **(iii) ණයගැති හා ණයහිමි ලේඛනය** | | |
| 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණයගැති හා ණයහිමි ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2021 වර්ෂයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබයි. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණයගැති හා ණයහිමි ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ භාණ්ඩාගාර අවසන් අග්‍රිම සාරාංශ වාර්තාව (SA – 70) අනුව අග්‍රිම ලැබීම් එකතුව රු.375,440,570 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ වූ අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව (ඒසීඒ - 3) සහ අග්‍රිම ලැබීම් ලිපි ලේඛන අනුව අග්‍රිම ලැබීම් එකතුව රු.368,469,291 ක් වීම නිසා භාණ්ඩාගාර වාර්තා සමඟ සැසඳීමේදී රු.6,971,279 ක අග්‍රිම ලැබීම් වෙනසක් නිරීක්ෂණය විය. | අග්‍රිම ලැබීම් හා ගෙවීම් සාරාංශ වාර්තා අනුව ලැබීම් රු.368,469,291 ක් බව තහවුරු කරමි. | භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ශේෂයෙහි වෙනස නිවැරදි කරවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

### 2.2 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිටකොටුව ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණමය අළුත්වැඩියාවට අදාළ ගිවිසුම ප්‍රකාරව එම කාර්යය 2019 අගෝස්තු 01 දින ආරම්භ කර 2020 මැයි 01 දින අවසන් කළ යුතුව තිබුණි. 2021 නොවැම්බර් 30 දින වන විට කාලය දීර්ඝ කිරීම් අවස්ථා 02 කදී ලබාදී තිබූ අතර, 2022 මාර්තු මස වන විටත් එම කාර්යයන් අවසන් කර නොතිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්තුව නියමිත පරිදි ඉටු නොකිරීම හේතුවෙන් දෛනිකව සියයට 0.05 ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව (Delay charges) අයකර ගත යුතු වුවත්, එම ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | අවසාන බිලෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට සටහන් කරගෙන ඇත. | ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව (Delay charges) අයකර ගත යුතුය. |

## 2.3. බැරකම් හා බැඳීම් වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ බැඳීම් හා බැරකම් වලට එළඹීම පිළිබඳව පරීක්ෂා කිරීමේදී 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වැය විෂයයන් 10 කට අදාළව ප්‍රතිපාදන ඉතිරි කිරීම් ඉක්මවා එකතුව රු.2,978,623 ක බැරකම් වලට එළඹී තිබුණි. | පවිත්‍රතා, ජලය, විදුලිය, දුරකථන සඳහා වන මාසික බිල්පත් ගෙවීම් කර ඇත. | ප්‍රතිපාදන ඉතිරි කිරීම් නොඉක්මවා බැරකම් වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

## 2.4 සීමා ඉක්මවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂයේ ර.නි.අ. "බී" ගිණුමේ ලැබීම්වල අවම සීමාව රු.10,800,000 ක් වූ අතර, එම සීමාව රු.9,000,000 දක්වා සංශෝධනය කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණද, 2022 මාර්තු මස දක්වා එම අනුමැතිය ලැබී නොතිබුණි. ඒ අනුව අනුමත අවම ලැබීම් සීමාව රු.10,800,000 ක් වූ අතර, වර්ෂය තුළ මුළු ලැබීම් රු.9,162,499 ක් වීම නිසා එකතුව රු.1,637,501 කින් අවම ලැබීම් සීමාවට ළඟාවී නොතිබුණි. | සීමා සංශෝධනයට අදාළ සංදේශය මුදල් අමාත්‍යවරයා වෙත යොමු කර ඇත. | අවම ලැබීම් සීමාවට ළඟා වීමට හෝ සීමා සංශෝධනය කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | දෙපාර්තමේන්තුව සතු මෝටර් රථවාහන 05 ක ඉන්ධන දහනය පිළිබඳව 2019 වර්ෂයෙන් පසුව පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | මෙම වාහන වල අළුත්වැඩියා කටයුතු නිම වූ පසුව ඉන්ධන දහනය පරීක්ෂා කරමි. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මුදල් රෙගුලාසි 268 (අ) සහ 1646 | - | මෙම මුදල් රෙගුලාසි ප්‍රකාරව මාසික සාරාංශ වාර්තා සමඟ ධාවන සටහන් විස්තර නියමිත දිනවලදී ඉදිරිපත් කර නොතිබුණි. | මාසික සාරාංශ වාර්තා වෙනම ඉදිරිපත් කර නොමැති අතර, ඉදිරියේදී ඉදිරිපත් කරමි. | මෙම මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 1645 (අ) | - | දෙපාර්තමේන්තුව සතු වාහන සඳහා ලොග් සටහන් පොත් පවත්වාගෙන යනු ලැබුවද, ඒවායේ යාවත්කාලීනව තොරතුරු සටහන් කර නොතිබුණි. | අතපසුවීමකින් ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොමැත. ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරමි. | මෙම මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 01 හි (ආ) වන වගන්තිය | - | 2021 දෙසැම්බර් 31 දිනට මියගිය සේවකයින් 03 දෙනෙකුට අදාළව එකතුව රු.229,420 ක මුදලක් නිරවුල් කරගෙන නොතිබුණි. | මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත තොරතුරු යොමු කර ඇත. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

## 2.6 අවිධිමත් ගනුදෙනු

---------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් 2011 අගෝස්තු 10 දින සිට 2021 ජූලි 31 දින දක්වා වර්ෂ 10 ක කාලසීමාවකට බදු පදනම මත ගොඩනැගිල්ලක් හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත ලබාදී තිබුණි. එහි නවීකරණ කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ එකඟතාවයකින් තොරව 2013 වර්ෂයේදී එම බදු කාලසීමාව වර්ෂ 35 ක් දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගැනීමටද හස්ත කර්මාන්ත මණ්ඩලය කටයුතු කර තිබුණි. එම ගොඩනැගිල්ල වෙනුවෙන් වූ වරිපනම් ගාස්තු, ජල ගාස්තු වැනි වියදම් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබූ අතර, 2021 ජූලි 31 දිනට දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුළු හිඟ බදු කුළී එකතු වටිනාකම රු.91,921,106.60 ක් විය. තවද, 2021 අගෝස්තු මස සිට ගෙවිය යුතු මාසික කුළී මුදල නව බදු ගිවිසුම ප්‍රකාරව සිදු කළ යුතු වුවත්, දෙපාර්ශවයේම එකඟතාවයකින් යුතුව අත්සන් කළ යුතු නව බදු ගිවිසුමකට එළඹීමට සහ ඒ අනුව බදු කුළී ගෙවීමකින් තොරව අනවසරයෙන් හස්ත කර්මාන්ත මණ්ඩලය මෙම ගොඩනැගිල්ල භාවිතා කරමින් තිබුණි. | නව බදු ගිවිසුමක් සකස් කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, හිඟ බදු මුදල් අයකර ගැනීමෙන් පසුව ගිවිසුම්ගත වීමට අපේක්ෂා කරමි. | නව බදු ගිවිසුමකට එළඹීමට සහ ඒ අනුව බදු කුළී ගෙවීමට ක්‍රියා කළ යුතුය. |

**2.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ ර.නි.අ."බී" ගිණුමට අදාළ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය සේවකයින්ගෙන් අයවිය යුතු මුළු ණය මුදල රු.934,277 ක් විය. 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සමඟ නිකුත් කළ මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) සහ (ඊ) අනුව ක්‍රියා කර එම ණය නිරවුල් කිරීමට ක්‍රියා කර නොතිබුණි. | නිරවුල් නොවූ ණය අතහැර දැමීම සඳහා, අයකරගත නොහැකි ශේෂ කපා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමැතිය ඉල්ලා ලිපි යොමු කර ඇත. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව අයවිය යුතු මුදල් නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

**2.8. තැන්පත් ශේෂයන්**

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයේ සිට 2019 දක්වා වූ කාලය තුළ තැන්පතු ගිණුම්වල තැන්පත් කළ එකතු වටිනාකම රු.5,213,776 ක වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු නිරවුල් කිරීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට පියවරගෙන නොතිබුණි. | ගිවිසුම් තව දුරටත් ක්‍රියාත්මක නොවන සහ උපදේශන ආයතන නිර්දේශ කර ඇති ගෙවීම් නිරවුල් කිරීමටත්, ආදායමට බැර කිරීමට ඇති ශේෂ පියවීමටත් කටයුතු කරමි. | වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු නිරවුල් කිරීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට පියවර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) හම්බන්තොට කෞතුකාගාරයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.22,509,349 ක ව්‍යාපෘතියකට 2015 නොවැම්බර් 30 දින ගිවිසුමකට එළඹී තිබුණි. 2016 අප්‍රේල් 30 දින වැඩ අවසන් | අවස්ථා කිහිපයකදී මෙම අඩුපාඩු සකසා දෙන මෙන් දන්වා සිටියද කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. මෙය ඉතා ඉක්මණින් අවසන් කිරීමට කටයුතු කරමි. | මෙම අඩුපාඩු අදාළ පාර්ශවයන් මඟින් කඩිනමින් සම්පූර්ණ කරවා ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 18.09 ගෙවීම් කර තිබූ අතර, පවතින අඩුපාඩු සකසා දීමේ එකඟතාවය මත මෙම ගොඩනැගිල්ල භාරගෙන තිබුණද, එම අඩුපාඩු 2021 දෙසැම්බර් 31 දක්වා සම්පූර්ණ කරගෙන නොතිබුණි. | | |
| (ආ) පිටකොටුව ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණය සහ අළුත්වැඩියා කිරීම් සඳහා එකතුව රු.97,259,127 ක පිරිවැය ඇස්තමේන්තුවකට 2019 වර්ෂයේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. 2020 මැයි 01 දින වැඩ නිම කිරීමට නියමිතව තිබූ මෙම කාර්යය සඳහා වන කාලය, 2021 නොවැම්බර් 30 දින දක්වා අවස්ථා දෙකකදී කාලය දීර්ඝ කරගෙන තිබුණි. මෙම කාර්යය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.62,863,055 ක් ගෙවීම් කර තිබූ අතර, එදිනට භෞතික ප්‍රගතිය සියයට 51 ක් විය. අනුමත ව්‍යාපෘති කාලය දීර්ඝ කර ගැනීමකින්ද තොරව මාස 03 ක පමණ කාලයක් ගතවී ඇති මෙම ව්‍යාපෘතියේ කටයුතු 2022 මාර්තු මස වන විටත් නිමකර නොතිබුණි. | 2022 අප්‍රේල් වන විට සියයට 93 පමණ වැඩ නිමකර ඇත. ව්‍යාපෘති කාර්යය කඩිනමින් නිම කර විධිමත්ව භාරදෙන ලෙස ලිඛිතව දන්වා ඇත. ව්‍යාපෘති කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කරමින් පවතී. | කඩිනමින් මෙම ව්‍යාපෘතියේ කටයුතු නිමකර දෙපාර්තමේන්තුව වෙත ගොඩනැගිල්ල භාර ගැනීමට ක්‍රියා කළ යුතු වේ. |
| (ඇ) 2021 අගෝස්තු 04 දින රු.මිලියන 98.55 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත වැඩ ආරම්භ කරන ලද ජාතික කෞතුකාගාරයේ පුස්තකාලයේ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2022 ජනවාරි 31 දින වැඩ අවසන් කළ යුතුව තිබුණි. 2022 මාර්තු මස වන විට කාර්යය අවසන් කිරීමේ කාලය අවසන් වී මාස 02 ක් ගතවී තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.23,429,655 ක් ගෙවීම් කර තිබූ එම ව්‍යාපෘතියේ භෞතික කාර්යය සාධනය සියයට 35 ක් විය. | ව්‍යාපෘතියට අත්‍යාවශ්‍ය අයිතම් විදේශ වලින් ගෙන්වා ගැනීමට නොහැකි වී ඇත. ඒ සඳහා අමාත්‍යාංශ ලේකම් මඟින් ඉල්ලීම් සිදු කර ඇත. පිළිතුරු ලැබී නැත. | පුස්තකාල ගිණි ආරක්ෂණ පද්ධතිය ඉතා වැදගත් කාර්යයක් බැවින් එම කාර්යය නිම කරවා ගැනීමට අවධානය යොමු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) 2021 අගෝස්තු 16 දින රු.මිලියන 11.6 ක ඇස්තමේන්තුවක් මත වැඩ ආරම්භ කරන ලද ජාතික කෞතුකාගාරයේ ගෘහ භාණ්ඩ ප්‍රදර්ශන මැදිරිය සැකසීමේ ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.4,919,333 ක් ගෙවීම් කර තිබුණි. භෞතික ප්‍රගතිය සියයට 45 ක් පමණ වූ මෙම ව්‍යාපෘතියේ කටයුතු 2022 මාර්තු මස වන විට කොන්ත්‍රාත්කරු විසින් අතරමඟ නතර කර දමා තිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් එම ව්‍යාපෘතිය අතහැර දැමීම හේතුවෙන් අයකරගත යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | අයකර ගත යුතු මුදල් අයකර ගැනීමටත්, ව්‍යාපෘතිය අවසන් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමටත් ක්‍රියා කළ යුතු වේ. |

**3.2. ප්‍රසම්පාදනයන්**

------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය ප්‍රකාරව වැට් බදු සඳහා මුදල් ගෙවීමෙන් පසුව ඊළඟ මස 15 දින හෝ ඊට පෙර එකී වැට් බදු ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දැනුම්දිය යුතු වුවත්, පිටකොටුව ඕලන්ද කෞතුකාගාරය අළුත්වැඩියාවට අදාළව ගෙවීම් කිරීමේදී වැට් බදු ගෙවීම් විස්තර දැනුම්දී නොතිබුණි. | මෙම වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඊ මේල් මඟින් යොමු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මෙම වගන්තිය අනුව ක්‍රියා කළ යුතු වේ. |

**3.3. පාඩු හා හානි**

----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්තනගල්ලෙන් සොයාගත් පැරණි පාරුව 1998 වර්ෂයේ සිට ජාතික කෞතුකාගාර උද්‍යානයේ නැගෙනහිර අන්තයෙහි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සකස් කළ ටැංකියක ජලයෙහි බහා තිබූ අතර, පසුව සංරක්ෂණමය කාර්යයන් සඳහා එම පාරුව 2021 වර්ෂයේදී පැරණි කරත්ත තැන්පත් කර තිබූ මැදිරිය වෙත ගෙන ගොස් තිබුණි. මෙම පාරුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කිරීම සඳහා දීර්ඝ කාලයක සිට විවිධ පියවර ගනු ලැබුවද, එම සංරක්ෂණ කටයුතු නිසි පරිදි ඉටු නොකිරීම නිසා කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශනයට තිබූ ඉතා වටිනා පුරාවස්තුවක් දිරාපත් වී සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි. | මෙම සංරක්ෂණමය කාර්යය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සිදු කළ අතර, මෙම දෙපාර්තමේන්තුව ස්ථානයක් සැපයීම පමණක් සිදු කර ඇත. | ආයතනයේ විෂයය පථයට අදාළ නොවන සංරක්ෂණමය කාර්යය සහ ඒවා සංරක්ෂණයට පෙර මහජන ප්‍රදර්ශනයට භාර නොගත යුතු වේ. |

**3.4. කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පිටකොටුව ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණමය අළුත්වැඩියාවන් රු.මිලියන 97.26 ක ඇස්තමේන්තු වටිනාකමින් රු.මිලියන 62.8 ක් පමණ වැයකර නිම කරමින් පැවතුණි. පිටකොටුව කුමාර වීදියේ පිහිටා තිබෙන වසර 350 ක් පමණ පැරණි මෙම කෞතුකාගාරය ඉදිරිපිට වාහන නවතා තැබීමට පහසුකම් නොමැති වීම, එය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට විශාල බාධාවක් වී තිබූ අතර, 2019 වර්ෂය දක්වා තිබූ එම කෞතුකාගාරය ඉදිරිපිට වූ රථගාල් කිරීමේ පහසුකම් යළි ලබා ගැනීමට කළමනාකරණයට නොහැකි වී තිබුණි. | මේ සඳහා කිහිපවරක් ඉල්ලීම් සිදු කලද, එය සිදු කළ නොහැකි බව කොළඹ නගර සභාවට දන්වා ඇත. | විශාල මුදලක් වැයකර සංරක්ෂණය කළ මෙම කෞතුකාගාරය මහජන ප්‍රදර්ශනය සඳහා භාවිතා කිරීමට වාහනයක් ගාල් කිරීමේ පහසුකම අත්‍යාවශ්‍ය වන අතර, එම පහසුකම අතීතයේ තිබූ බැවින් එය ලබා ගැනීමට ක්‍රියා කළ යුතුයි. |
| (ආ) කොළඹ ජාතික කෞතුකාගාරයේ උද්‍යාන නවීකරණ ව්‍යාපෘතියේ අදියර I සහ IV සඳහා ප්‍රථමයෙන් පිළියෙල කර තිබූ මුළු පිරිවැය වටිනාකම රු.45,664,195 ක් වූ අතර, සංශෝධිත මුළු පිරිවැය වටිනාකම රු.50,055,355 ක් විය. නමුත් කොන්ත්‍රාත්තුව පිරිනැමූ වටිනාකම රු.43,337,970 ක් විය. ඒ අනුව සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව සහ ඉටු කරන ලද කොන්ත්‍රාත් කාර්යය අතර, විචලනය සියයට 18.37 ක් එනම්, රු.9,930,968 ක් වූ අතර, ඒ අනුව සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම ලෙස රු.53,268,938 ක් කාර්යය අවසානයේදී මිණුම් කර ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. මෙම කාර්යය ආරම්භයේදී ශක්‍යතා අධ්‍යයනයක් කර ප්‍රසම්පාදන කාර්යය නිවැරදිව හඳුනා නොගැනීම සහ ප්‍රමාණ වැරදීම් (Quantity error) හේතුවෙන් එකතුව රු.9,930,968 ක විචලන මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි. | මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු හා ප්‍රමාණ පත්‍ර සියල්ල උපදේශන ආයතනය විසින් සකසන ලදී. එම ආයතනයේ නිර්දේශ මත ගෙවීම් සිදු කර ඇත. | ආයතනය විසින් උපදේශන ආයතනය මත යැපීමට ක්‍රියා නොකල යුතු අතර, අමාත්‍යාංශ සහයද ලබාගෙන ක්‍රියා කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ ඇති අනුරාධපුර සහ ගාල්ල ජාතික කෞතුකාගාර පිහිටුවා තිබූ ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට රාජ්‍ය ආයතන සමඟ ලිපි හුවමාරු කර තිබුණද, 2022 මාර්තු මස වන විටත්, එම ඉඩම් පවරා ගැනීමට නොහැකි වී තිබුණි. | ඉඩමේ භුක්තිය පවරා ගැනීම කඩිනම් කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත ලිපි යොමු කර ඇත. | මෙම ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් ප්‍රාදේශීය කෞතුකාගාර වන ඕලන්ද යුග කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය හා මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය සම්බන්ධයෙන් දේපළ පවරා ගැනීම් කටයුතු විගණිත දින වන විට අවසන් කර තිබූ නමුත්, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර එම වත්කම්වල පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | මෙම දේපළ පවරා ගැනීමටත්, ඒවා තක්සේරු කර එම වත්කම්වල පිරිවැය ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 566 ක් වුවත්, තත්‍ය කාර්ය මණ්ඩලය 335 ක් වීම නිසා එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 231 ක් විය. මෙම පුරප්පාඩු වලින් විධායක මට්ටමේ තනතුරු 16 න් තනතුරු 08 ක් සහ තෘතියික මට්ටමේ තනතුරු 05 න් 04 ක් පුරප්පාඩු වී පැවති අතර, මෙම සේවක ඌනතාවය සමාලෝචිත වර්ෂය තුළදීද සම්පූර්ණ කර ගැනීමට අනුමැතිය ඉල්ලා ඇතත් නොලැබීම නිසා නොහැකි වී තිබුණි. | මෙම පුරප්පාඩු සම්පූර්ණ කර දෙන මෙන් ඉල්ලීම් කර ලිපි යොමු කර ඇත. | මෙම සේවක ඌනතා සම්පූර්ණ කර ආයතනයේ කාර්යය සාධනය ඉහළ නැංවීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට අනුමත ද්විතීයික මට්ටමේ කාර්ය මණ්ඩලය 242 ක් වුවත්, එම මට්ටමේ තත්‍ය කාර්ය මණ්ඩලය 96 ක් වීම නිසා එම කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඛ්‍යාව 146 ක් විය. එම පුරප්පාඩු තුළ ඇතුළත් MN – 4 ශ්‍රේණියේ ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර දෙපාර්තමේන්තුගත තනතුරක් වූ අතර, වසර ගණනාවක සිට පුරප්පාඩුවී පැවති, ඉතා වගකීම් සහගත කාර්යභාරයක් ඉටු කළ යුතු මෙම තනතුර සම්පූර්ණ කර ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලිඛිත අවසර ඉල්ලා සිටියද, අවසර නොලැබීම නිසා එම තනතුර තවදුරටත් පුරප්පාඩු වී පැවතුණි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කාර්යය මණ්ඩල යාවත්කාලීන කිරීම කාර්තුමය වශයෙන් දන්වා යවා ඇත. | මෙම සේවක ඌනතා සම්පූර්ණ කර ආයතනයේ කාර්යය සාධනය ඉහළ නැංවීමට ක්‍රියා කළ යුතුය. |